චක්‍රලේඛ අංකය : 95/11

මගේ අංකය : 4/ගුරුආ/විවිධ
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය", ශ්‍රී ජයවර්ධනපුර
බත්තරමුල්ල.

1995.03.31 දින

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාශ භාර නි.අ.අ වරුන්.

# ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය

අධ්‍යාපනය පිළිබඳ ක්‍රියාවලිය වඩාත් ඵලදායක අන්දමින් සිදු කළ හැකි වන වන පරිදි හා ශිෂ්‍ය පිරිසගේ ද ගුරු භවතුන්ගේ ද උපරිම සුබසාධනය සැලසෙන පරිදි ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියක් සකස් කළ යුතු යයි රජය තීරණය කොට තිබේ. මෙම ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියට පහත සඳහන් සිද්ධාන්තයන් පදනම් විය යුතු යයි අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කොට තිබේ.

(1) අධ්‍යාපනය සෑම විටම ශිෂ්‍ය කේන්ද්‍රීය විය යුතු බැවින් ගුරුවරුන්ගේ ස්ථාන මාරු ලබා දීමේදී ශිෂ්‍යයන්ගේ අවශ්‍යතා මුඛ්‍ය ස්ථානයෙහි ලා සැලකිය යුතු ය.

(2) අධ්‍යාපනයෙහි ගුණාත්මක භාවය වර්ධන කිරීමේ කාර්ය රඳා පවත්නේ ගුරුවරුන්ගේ දැනීම හා කුශලතාවය මත බැවින් ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය තුළින් ගුරු භවතුනට සිය දැනීම හා කුශලතාවයන් වර්ධනය කර ගැනීම සඳහා අවකාශ සැලසිය යුතු ය.

(3) ගුරු භවතුනට සුරක්ෂිතභාවය පිළිබඳ විශ්වාසය තහවුරු වන ආකාරයට ද ශාස්ත්‍රීය නිදහස ආරක්ෂාවන ආකාරයට ද අසාධාරණ ගුරු මාරු පිළිබඳ අහිසි බියකින් තොරව සේවය කළ හැකි වන පරිද්දෙන් සහ සේවා තෘප්තිය උපරිම අයුරින් හිමි කරගත හැකි වන ආකාරයෙන් ද ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය සකස් විය යුතුය.

(4) අධ්‍යාපන සම්බන්ධයෙන් ප්‍රදේශගතව දක්නා ලැබෙන විෂමතාවයන් හැකිතාක් දුරට අවම කර ලීම ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි මූලික අරමුණක් විය යුතුය.

(5) කිසියම් ප්‍රදේශයකට හා පාසලකට සීමා වී ඇති මානව සම්පත් දිවයිනේ අනෙක් ප්‍රදේශයන්හි වෙසෙන ජනතාවට ද ප්‍රයෝජනවත් වන ආකාරයට ගුරු සේවයෙහි නියුතු මානව සම්පත් සාධාරණ පරිද්දෙන් බෙදී යන බවට ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය තුළින් වග බලා ගත යුතුය.

(6) ක්ෂේත්‍රයෙහි මානව සම්පත් විධිමත් කළමණාකරණය තුළින් උපරිම කාර්යක්ෂමතාවය කෙරෙහි යොමු කිරීම මෙම ප්‍රතිපත්තිය මගින් සලස්වාලිය යුතු ය.

(7) කිසියම් ගුරුවරයෙකුට විරුද්ධව විනයානුකූලව ක්‍රියාමාර්ග ගනිමින් පවත්නා අවස්ථාවක හෝ එසේ කරනු ලැබීම ආසන්න අවස්ථාවක එම විනයානුකූල ක්‍රියා මාර්ගය පහසු කරලීම සඳහා සිදු කෙරෙන ස්ථාන මාරුවකදී හැර අන් සෑම අවස්ථාවකදීම ගුරු සේවයේ ස්ථාන මාරු විධිමත් පරිදි පිහිටුවන ලද ගුරු ස්ථාන මාරු මණ්ඩලයක නිර්දේශය මතම සිදු විය යුතු ය.

02 කිසියම් ගුරු භවතකුට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගනිමින් පවත්නා අවස්ථාවක හෝ

එසේ විනයානුකුල ක්‍රියා මාර්ග ගැනීමට ආසන්නව පවත්නා අවස්ථාවක හෝ හුදෙක් ම සේවයේ අවශ්‍යතාවය මත ඉතා හදිසි සුවිශේෂ අවස්ථාවන්හිදී හෝ ගුරු භවතෙකුගේ ඉල්ලීම පරිදි සෞඛ්‍ය හේතුන් මත හෝ හැර සැමවිටම ගුරුවරුන්ගේ ස්ථාන මාරු ක්‍රියා කළ යුත්තේ විධිමත් පරිදි පිහිටුවන ලද ගුරු මාරු මණ්ඩලයක නිර්දේශය මත පමණි. සේවයේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් ගනු ලබන ගුරුවරුන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් වුවද සති දෙකක් ඇතුළත ගුරු මාරු මණ්ඩලය රැස්කරවා ඒ පිළිබඳව ගුරු මාරු මණ්ඩලයට දැනුම් දිය යුතු ය.

03 පහත සඳහන් මට්ටම්වල ගුරු මාරු මණ්ඩල ස්ථාපනය කළ යුතු ය.

(1) කලාපීය අධ්‍යාපන කාර්යාලය

(2) පළාත් අධ්‍යාපන කාර්යාලය/අතිරේක පළාත් අධ්‍යාපන කාර්යාලය

(3) කැබිනට් අමාත්‍යාංශය

## 04 ගුරු මාරු මණ්ඩල සංයුතිය

ආයතන සංග්‍රහයේ 3.5 ඡේදයෙහි සඳහන් සාමාජිකයින්ට අමතරව දිවයිනෙහි එක් පළාතකට වැඩි පළාත් සංඛ්‍යාවක සිය සාමාජික සාමාජිකාවන් සේවය කරනු ලබන්නා වූ දා වෘත්තීය සමිති පනත යටතේ ලියා පදිංචි කර ඇත්තා වූ ද එක් එක් වෘත්තිය සමිතියක් විසින් නම් කරන ලද නියෝජිතයෙකුගෙන් ද ගුරු මණ්ඩල සමන්විත විය යුතු ය.

## 05 පාසල් වර්ගීකරණය

(1) වඩා ප්‍රිය මනාප

(2) ප්‍රිය මනාප

(3) ප්‍රිය මනාප නොවන

(4) දුෂ්කර

යනුවෙන් පාසල් කොටස් 04 කට වර්ගීකරණය කරනු ලැබේ. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙහි අදහස් ද විමසා රේඛීය අමාත්‍යාංශය විසින් මෙම පාසල් වර්ගීකරණය සිදු කළ යුතු ය.

## 06 ස්ථාන මාරු සිදු කරන කාල සීමාව

ඉහත "02 වන ඡේදයේ" විශේෂිත කොට දක්වා ඇති අවස්ථාවන්හිදි හැර ගුරුවරුන්ගේ ස්ථාන මාරු ශිෂ්‍යයන්ට ද ගුරු භවතුන්ට ද ඇති විය හැකි අපහසුතාවයන් අවම කරනු පිණිස සෑම වර්ෂයක ආරම්භයේදී සිදු කළ යුතුය.

## 07 ඉල්ලුම් පත් කැඳවීම

වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවීම සෑම වර්ෂයකම ජුනි මාසයේ 1 වෙනි දින සිට 30 වෙනි දින දක්වා කාල සීමාව ඇතුළත සිදු කළ යුතුය.

## 08 ගුරු මාරු මණ්ඩල රැස්වීම්

ලැබී ඇති සියලුම ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් සළකා බලා තීරණ ගැනීම සඳහා ගුරු මාරු මණ්ඩලය සෑම වර්ෂයකම අගෝස්තු මස 01 වෙනි දින සිට 31 වෙනි දින දක්වා කාලය ඇතුළත රැස්විය යුතු ය.

## 09 සංඛ්‍යා ලේඛන තොරතුරු සපයා ගැනීම

සෑම පාසලක් සම්බන්ධයෙන්ම පවත්නා වූ ගුරු මාරු පිළිබඳ විස්තර අදාළ බලධාරීන් විසින් ජුලි මස 31 වෙනි දිනට පෙර සපයා සංග්‍රහ කොට ගත යුතු ය.

10 **ස්ථාන මාරු ලිපි නිකුත් කිරීම.**

සියළුම වාර්ෂික ස්ථාන මාරුවීම් ලිපි සැප්තැම්බර් මස 15 වෙනි දිනට පෙර නිකුත් කළ යුතු ය.

11 **අභියාචනා භාර ගැනීම**

සෑම වර්ෂයකම සැප්තැම්බර් මස 15 වෙනි දින සිට දක්වා කාලය තුළ අභියාචනා ඉදිරිපත් කළ හැක.

12 **අභියාචනා මණ්ඩල තීරණ**

අභියාචනා මණ්ඩලය විසින් සියලුම අභියාචනා ඔක්තෝබර් මස 15 වෙනි දින සිට නොවැම්බර් 30 වෙනි දින අතර වූ කාලය තුළ සලකා බලා තීරණ සහිත ලිපි නොවැම්බර් මස 30 වෙනි දිනට නිකුත් කළ යුතු ය.

13 සෞඛ්‍ය හේතුන් මත කෙරෙන ගුරු මාරු, අන්‍යොන්‍ය සුහද ස්ථාන මාරු හා වෙනත් ඉතාමත් හැකි කරුණු මත කරනු ලබන ගුරු භවතුන්ගේ ඉල්ලීම් අනුව සිදු කරන ගුරු මාරු සම්බන්ධයෙන් විධිවිධානයන්ගෙන් බැහැරව ජාතික ප්‍රතිපත්තියෙහි මූලධර්මයට හානියක් නොවන පරිදි ස්ථාන ලබා දිය හැක.

14 මෙම චක්‍රලේඛයෙහි විශේෂ කොට සඳහන් කර ඇති අවස්ථාවන්හි හැර අනෙකුත් සෑම අවස්ථාවන්හිදී න්ගේ ස්ථාන මාරු සම්න්ධයෙන් ආයතන සංග්‍රයෙහි 03 වන ඡේදයෙහි විධිවිධාන අදාළ විය යුතු ඒ අනුව කටයුතු කළ යුතු ය.

15 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවෙහි සඳහන් පරිදි ගුරු සේවා ව්‍යවස්ථාවේ ඇතුළත් ස්ථාවර විසින් නම් කරනු ලබන පාසලක අවම කාල සීමාවක් සෑම ගුරු භවතකු විසින්ම සේවය කරන ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී වග බලා ගත යුතු ය. ඉහත වර්ග කරන ලද දුෂ්කර සම්බන්ධයෙන් නම් අවුරුදු 03 ක් ද ප්‍රිය මනාප නොවන පාසල් සම්බන්ධයෙන් නම් අවුරුදු 04 ක් ද අවම කාල සීමාවක් සෑම ගුරු භවතකුම සේවයේ යෙදිය යුතු ය. ප්‍රිය මනාප පාසලක් සම්බන්ධයෙන් වසර 08 ක් සහ ඉතා ප්‍රිය මනාප පාසලක් සම්බන්ධයෙන් වසර 06 ක උපරිමයකට ගුරු භවතුන්ගේ සේවා කාලය යටත් කළ යුතු ය.

16 සෞඛ්‍ය හේතුන් මත කිසියම් ගුරුභවතකු විසින් ස්ථාන මාරුවක් ඉල්ලා සිටින අවස්ථාවකදී තම තත්ත්වය තහවුරු කිරීම පිණිස අදාල ක්ෂේත්‍රයෙහි විශේෂඥ වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය අමතරව ප්‍රතිකාර සටහන් වල පිටපතක් ද ඉදිරිපත් කළ යුතු ය. ගර්භනී මාතාවක් සම්බන්ධයෙන් වූ කාල අවදානම් සාධක වශයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පිළි ගනු ලබන සාධකයක් ස්ථාන මාරු සඳහා සෞඛ්‍ය හේතුන් වශයෙන් සැලකිය හැක. ගුරු භවතාගේ පෞද්ගලික අමතරව ගුරු භවතා සමග එක්ව සිටීම කෙලින් ම බලපෑ හැකි මට්ටමේ සිටි පහත සඳහන් පවුලේ සාමාජිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය ද ස්ථාන මාරු ලබාදීම සඳහා සැලකිල්ලට ගනු ලැබිය හැක.

1 කලත්‍රයා

2 දරුවන්

3 ගුරු භවතා අවිවාහක නම් දෙමාපියන්

17 ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ස්ථාන මාරු ක්‍රියාවලිය හැකි සෑම අවස්ථාවකදීම ගුරු මාරු ප්‍රතිපත්තිය හා සමගාමී විය යුතු ය.

18 **මූල් පත්වීම**

ගුරුවරයෙකු වශයෙන් බඳවා ගැනීමේදී මූල් පත්වීම් දුෂ්කර හෝ ප්‍රිය මනාප නොවන යන කාණ්ඩයට අයත් පාසලක අදාළ අවම කාල සීමාවට යටත් කොට එබඳු පාසලකට ලබා දිය යුතුය..

19 **විවිධ කරුණු**

මෙතෙක් සිය සේවා කාලය තුළ කිසිදු දුෂ්කර හෝ ප්‍රිය මනාප නොවන පාසලක සේවය කර නොමැති සෑම ගුරු භවතෙක්ම එබඳු පාසලක නියමිත අවම සේවා කාලය සඳහා ස්ථාන මාරු ලබා දීමට යටත් කළ යුතු ය. එසේ වුවද, වයස අවුරුදු 53 ඉක්මවා ඇති ගුරු භවතුන් මෙම විධිවිධානයට යටත් නොකළ යුතු ය.

20 මෙම චක්‍රලේඛය මගින් සලස්වනු ලබන ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියෙහි සිද්ධාන්තයට යටත්ව සෑම ගුරු මාරු මණ්ඩලයක් විසින් ම සිය කාර්ය භාරයට අදාළව කාර්ය සංවිධාන සංග්‍රහයක් සකස් කොට ගෙන ඒ අනුව ක්‍රියා කළ යුතු ය.

මෙම ගුරුමාරු ප්‍රතිපත්තිය ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් 1995 ජනවාරි මස 18 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමත කරනු ලැබ ඇති බැවින් ගුරුවරුන්ගේ ස්ථාන මාරු පිළිබඳ ක්‍රියා කරන සෑම බලධාරියෙකු විසින්ම මෙම ප්‍රතිපත්ති අනුගමනය කළයුතු වේ.

සේනානායක උපසේන
අතිරේක ලේකම්

අත්/කලේ : එම්. ඩී. ඩී. පීරිස්
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්

පිටපත්

(1) අ.සේ.ම.ලේ
(2) සියලුම පළාත් සභා ලේකම්වරුන්
(3) සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
(4) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම අංශ ප්‍රධානීන්
(5) අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
(6) විභාග කොමසාරිස් ජනරාල්
(7) ප්‍රකාශන කොමසාරිස් හා නි.අ.අ.ජ.
(8) විගණකාධිපති
(9) සියළුම ගුරු සංගම් ලේකම්වරුන්ට,